# පුරවැසි අධ්‍යාපනය I, II

**9 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය - 2023**

## පුරවැසි අධ්‍යාපනය I

### ලකුණු දීමේ පටිපාටිය

| | | | | |
|---|---|---|---|---|
| 01. තාක්ෂණය | 02. පුරවැසි සභාව | 03. සභාපති | 04. දේශීය | 05. යහජීවනය |
| 06. √ | 07. X | 08. X | 09. √ | 10. √ |
| 11. (4) | 12. (3) | 13. (3) | 14. (1) | 15. (3) |
| 16. C | 17. D | 18. A | 19. E | 20. B |

## පුරවැසි අධ්‍යාපනය II

### ලකුණු දීමේ පටිපාටිය

01. (i) පවුල / පාසල / ආගමික ආයතන / සමාජ ආයතන

(ii) දේශීය නීතිය / අන්තර්ජාතික නීතිය

(iii) ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය / පළාත්බද මහාධිකරණය / මහාධිකරණය / දිසා අධිරණය / මහේස්ත්‍රාත් අධිකරණය

(iv) ජනාධිපතිවරණය / මහා මැතිවරණය/පාර්ලිමේන්තු මැතිවරණය / පළාත් සභා මැතිවරණය / පළාත් පාලන මැතිවරණය

(v) පුරවැසිභාවය අහිමි වීම / සිහිවිකල තැනැත්තකු ලෙස නීතියෙන් නම් කර තිබීම / ප්‍රජා අයිතිය අහෝසි කර තිබීම / ජීවිතාන්තය දක්වා සිරගත කරනු ලැබුවකු වීම / මරණීය දණ්ඩනය නියම වූ පුද්ගලයෙකු වීම

(vi) හිස නමා ආචාර කිරීම / සුමෝ ක්‍රීඩාව / කිමෝනාව

(vii) ක්ෂණික තේ / කාබනික තේ (දියර තේ) / හරිත තේ / පෙට්ටිවල ඇසුරුම් කරන ලද තේ / කළු තේ / කුඩා පැකට්වල ඇසුරුම් කරන ලද තේ

(viii) සහයෝගයෙන් කටයුතු කිරීම / බෙදාහදා ගැනීම / අන්‍යයන්ට ගරු කිරීම / සුහද බව / අන්‍යෝන්‍ය විශ්වාසය / අවංක බව / සුබවාදී වීම / යුතුකම් ඉටු කිරීම

(ix) සභාව කැඳවීම හා කල් තැබීම / සභාවේ මුලසුන දැරීම / මහජන උපයෝගිතා සේවා සැපයීමට මුල් වීම / පළාත් පාලන ආයතන සතු කටයුතු සංවිධානය කිරීම සහ මෙහෙයවීම

(x) වරිපනම්/බදු මුදල් / පළාත් පාලන අමාත්‍යවරයා විසින් පළාත් පාලන ආයතනවලට වෙන් කරනු ලබන ප්‍රදාන/ පළාත් පාලන ආයතන සතු දේපල බදු දීම්වලින්/කුලීයට දීමෙන් ලැබෙන මුදල් / පොදු සේවා සැපයීමෙන් ලැබෙන ආදායම් / නීති කඩ කිරීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණය මගින් අය කරන දඩ මුදල්වලින් ලැබෙන ප්‍රතිපාදන / ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හා අදාළ සභාවේ අනුමැතිය ඇතිව විදේශ රාජ්‍යවලින් ආධාරමය වශයෙන් ලැබෙන පරිත්‍යාග හා රාජ්‍ය සංවිධානවලින් ලැබෙන පරිත්‍යාග

02. (i) ළමා සමාජ / ක්‍රීඩා සමාජ / යෞවන සමාජ / ග්‍රාම සංවර්ධන සමිති / ගොවි සමිති / සුභ සාධන සමිති / වැඩිහිටි සමිති/ මරණාධාර සමිති / ආගමික සමිති / සමුපාකාර සමිති / වෘත්තිය සමිති / ශිෂ්‍ය සමිති

(ii) සාමාජිකයන් අතර යහපත් සබඳතා වර්ධනය කිරීම / ඥාතීන්, අසල්වාසීන් සමඟ යහපත් සබඳතා පැවැත්වීම / විවිධ පුද්ගලයන් සමඟ යහපත් සබඳතා පැවැත්වීම / යහපත් සමාජානුයෝජනයක් සඳහා මග පෙන්වීම / ආදරය, දයාව, කරුණාව වැනි ගුණාංග ප්‍රගුණ කිරීම / ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම / මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවිතය හා සමාජ විරෝධී විෂමචාර ක්‍රියා ආදියෙන් මුදවා ගැනීම / සංස්කෘතික හර රැක ගැනීමට හුරු කිරීම / අන්‍යයන්ට සවන්

දීමට හා එම අදහස්වලට ගරු කිරීම / එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දීම / ආදර්ශයෙන් මඟ පෙන්වීම / තමාගේ අභිවෘද්ධිය සමඟ වැඩිහිටියන් දෙන උපදෙස් පිළිපැදීමට යොමු කිරීම / චිත්තවේග පාලනයට හුරු කිරීම / පුද්ගලයන් හා සමාජය පිළිබඳ ව සුබවාදීව සිතීමට මඟ පෙන්වීම / දැරිය හැකි අල්පේච්ඡ ජීවන රටාවකට හුරු කිරීම / නීතිගරුක වීමේ අවශ්‍යතාව අවබෝධ කර දීම

(iii) මහාමාර්ගයේ විනය ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීම / නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවනතභාවය දැක්වීම / කැරලි, කෝලාහල, නීති විරෝධී මහජන උද්ඝෝෂණ මැඩ පැවැත්වීමේ කටයුතුවලට බාධා නොකිරීම / සාමය කඩ වන අවස්ථා පිළිබඳ ව දැනුම්වත් කිරීම / සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාමට සහාය ලබා නොදීම / අවශ්‍ය අවස්ථාවල දී සත්‍ය හා නිවැරදි තොරතුරු ලබා දීම / රාජ්‍ය හා මහජන දේපළ ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීම / අපරාධ පරීක්ෂණ සඳහා පොලිසියට සහාය ලබා දීම / අපරාධකරුවන් අල්ලා ගැනීමට පොලිසියට සහාය වීම / මද්‍යසාර, මත්ද්‍රව්‍ය හා අනෙකුත් සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීමට පොලිසියට සහාය දැක්වීම

03. (i) මිනිසාගේ පරිභෝජන රටාව වෙනස් වීම / නව රැකියා බිහි වීම / නව විලාසිතා බිහි වීම / නවීන වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ඇති වීම / ආහාර පානවල නිෂ්පාදනය හා භාවිතය වෙනස් වීම

(ii) මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම / මිනිසා අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම / මිනිසුන් යාන්ත්‍රීකරණය වීම / සමාජය සංකීර්ණ වීම / පරිසර දූෂණය වේගවත් වීම / මිනිසා විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වීම / තාක්ෂණයට දැඩි ලෙස යොමුවීම නිසා සමාජ සම්බන්ධතා බිඳ වැටීම

(iii) පරිගණක දත්ත සැකසුම් ශිල්පීන් / මෘදුකාංග ශිල්පීන් / උද්‍යාන සැකසුම් ශිල්පීන් / ජාන තාක්ෂණ ශිල්පීන් / ග්‍රැෆික් නිර්මාණකරුවන් / භාෂා පරිවර්තකයන් / විසිතුරු මල් වවන්නන් / ගෘහ නිර්මාණ ශිල්පීන් / සුරතල් මසුන් ඇති කරන්නන් / මාධ්‍ය ශිල්පීන් / උත්සව සංවිධානකරුවන් / දත්ත විශ්ලේෂකයන් / උපදේශන ශිල්පීන්

04. (i) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය / වක්‍ර ප්‍රජාත්නත්‍රවාදය

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම / වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම / ඡන්ද හිමි නාම ලේඛනයේ නම ඇතුළත් කර තිබීම / ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි කර නොතිබීම

(iii) විසිරී ඇති මහජන මතය ඒකරාශි කිරීම / තම පක්ෂයේ අරමුණු හා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු කිරීම / අනාගත නායකයන් පුහුණු කිරීම / ජනතාව දැනුම්වත් කිරීම / තම පක්ෂයට ප්‍රතිවිරුද්ධ අදහස් දරන දේශපාලන පක්ෂවල සාමාජිකයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අදහස්වලට ගරු කිරීම / ආණ්ඩු බලය අල්ලා ගැනීම සඳහා අනෙක් දේශපාලන පක්ෂ සමඟ තරඟ වැදීම / සමාජ ශුභසාධන සේවා සැපයීම

05. (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ප්‍රාදේශීය මට්ටම දක්වා පුළුල් කිරීම / ප්‍රාදේශීය අවශ්‍යතාවලට ගැළපෙන පරිදි කටයුතු කිරීම / ප්‍රජා සේවා විධිමත්ව පවත්වාගෙන යාමට පහසු වීම / ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ජාතික සංවර්ධනය වේගවත් කිරීම / ප්‍රාදේශීය ප්‍රතිපත්ති පදනම් කරගෙන ජාතික ප්‍රතිපත්ති සකස් කර ගැනීමට පහසු වීම / මධ්‍යම ආණ්ඩුවේ කටයුතු විමධ්‍යගත කිරීම මගින් ප්‍රාදේශීය පාලන කටයුතු පහසු කර ගැනීම / දේශපාලන නායකත්වය සඳහා තරුණ සහභාගීත්වය පුළුල් කිරීම / අනාගත දේශපාලන නායකයන් ප්‍රාදේශීය මට්ටමින් බිහි කර ගත හැකි වීම / හදිසි අවස්ථාව දී ක්ෂණිකව ක්‍රියාත්මක වීම පහසු වීම

(ii) ප්‍රාදේශීය සභා / නගර සභා / මහ නගර සභා

(iii) පුස්තකාල, කියවීම් ශාලා , ළමා උද්‍යාන, ක්‍රීඩා පිටි, ව්‍යායාම සඳහා ඇවිදීමේ මංතීරු පවත්වා ගෙන යාම / පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම / පොදු වැදගත්කමකින් යුත් ආගමික හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම / බල ප්‍රදේශයට අයත් මාර්ග අලුත්වැඩියා කිරීම / පාලම්, බෝක්කු ආදිය ඉදිකිරීම / අලුතින් මාර්ග තැනීම / විථි ආලෝක කිරීම / සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා සැපයීම / ජලාපවහන හා මලපවහන පද්ධති නිසි පරිදි පවත්වා ගෙනයාම / කාණු හා ඇළ මාර්ග නඩත්තු කිරීම / පොදු වැසිකිළි පවත්වාගෙන යාම / කසළ නිසි පරිදි

කළමනාකරණය කිරීම / කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම / සෞඛ්‍යයට අහිතකර ද්‍රව්‍ය විකිණීම සහ ප්‍රචාරය වැළැක්වීම / පොදු සුසාන භූමි, ආදාහනාගාර නඩත්තු කිරීම / පොදු නාන ළිං පවත්වාගෙන යාම / ප්‍රාදේශීය අවශ්‍යතා අනුව ජල පහසුකම් සැපයීම /අක්ෂි සායන, ළදරු සායන, මාතෘ සායන, ඩෙංගු වැනි වසංගත රෝග මර්දන වැඩසටහන්, බෝ නොවන රෝග මර්දන වැඩසටහන් පැවැත්වීම (සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න)

06. (i) තම හෘදය සාක්ෂියට අනුව සාධාරණ වූත්, යුක්ති සහගත වූත් ස්ථිර ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කිරීම

(ii) සාධාරණත්වය අගය කිරීම / ආදර්ශවත් ගතිපැවතුම් / ආවේගශීලී නොවීම / අවංක බව / පරාර්ථකාමිත්වය / මෘදු බව / තම මතය සෘජුව ප්‍රකාශ කිරීම / පුළුල් අවබෝධයක් සහිතව කටයුතු කිරීම / අන් මත ගරු කිරීම / යුක්තිගරුක බව / නීතිගරුක බව / සෘජු බව

(iii) පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරීම / ණය පහසුකම් සැපයීම / විවිධ ශුභසාධන සේවා පවත්වාගෙන යාම / සාමාජික ඉතුරුම් පවත්වාගෙන යාම / දැනුම්වත් කිරීමේ විවිධ වැඩසටහන් කිරීම / බැංකු සේවා සැපයීම / ප්‍රවාහන සේවා සැපයීම / කෘෂි නිෂ්පාදන මිල දී ගැනීම / රක්ෂන සේවා සැපයීම / රෝහල් පවත්වාගෙන යාම / අවමංගල්‍ය සේවා සැපයීම / ඉන්ධන පිරවුම්හල් පවත්වාගෙන යාම

07. (i) පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා මහජන නියෝජිතයෙක් වීම / රාජ්‍ය නිලධාරීහු පරිපාලන කටයුතු මෙහෙයවීම / පළාත් පාලන ආයතනයේ කටයුතු සම්බන්ධ තීන්දු තීරණ ගැනීම මහජන නියෝජිතයන් මගින් සිදු කිරීම

(ii) ජන වාර්ගික ජනගහන අනුපාතය / භූගෝලීය ප්‍රදේශය හා එහි භෞතික ලක්ෂණ / ජනගහනය හා ජන ඝනත්වය / ආර්ථික සංවර්ධන මට්ටම

(iii) ප්‍රදේශීය සම්පත් හඳුනා ගැනීම / මහජන ගැටලු හා අවශ්‍යතා හඳුනා ගැනීම / සංවර්ධන උපාය මාර්ග හඳුනා ගැනීම / සැලසුම් සකස් කිරීමට අවශ්‍ය සහාය ලබා දීම / අවශ්‍යතා සැලකිල්ලට ගෙන තීරණ ගැනීම / තීරණ ක්‍රියාත්මක කිරීමේ දී සොයා බැලීම / නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීම / නායකත්ව සැපයීම / වංචා, දූෂණ හා අල්ලස් ආදියට එරෙහිව කටයුතු කිරීම / රාජ්‍ය හා පොදු දේපළ අයථා ලෙස පරිහරණය කිරීම වැළැක්වීමට කටයුතු කිරීම / සංවර්ධන කටයුතු නිසි පරිදි අධීක්ෂණය කිරීම / තමන්ට අයත් රාජකාරි නිසි ලෙස ඉටු කිරීම